## නීති ආධාර කොමිෂන් සභාව-2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට නීති ආධාර කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය හීන වන ශේෂ ක්‍රමයේ සිට 2012 වර්ෂයේදී සරල මාර්ග ක්ෂය ක්‍රමයට පර්වර්තනය කර, ක්ෂය අනුපාතද වෙනස් කර තිබු නමුත්, එම වෙනස්වීම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ඒ අනුව 2011 වර්ෂයේ දී රු. 859,925 ක් වු ස්ථාවර වත්කම් ක්ෂය වීම සමාලෝචිත වර්ෂයේදී රු. 3,723,763 දක්වා වැඩි කර තිබුණි.

##### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල ජීවන වියදම්, හා අනෙකුත් දීමනා මත පදනම් කරගෙන ගණනය කරන ලද සේවක අර්ථසාධක අරමුදල් දායකය (12%) හා සේවක භාරකාර අරමුදල් දායකය (3%) පිළිවෙලින් රු.2,558,020 ක් හා රු.639,505 ක් විය. ඒ අනුව එකතුව රු.3,197,525 ක් වූ සම්පූර්ණ දායක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) එකතුව රු 1,250,000.ක් වූ ස්ථාවර තැන්පත් වලින් අයවිය යුතු රු198,479. ක් වූ පොලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) රු.1,250,000 ක් වූ ස්ථාරව තැන්පතු , මුදල් ශේෂයට එකතුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවා තිබු රු 32,000 ක් වූ ලියාපදිංචි ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) 1998 සිට 2008 දක්වා හා වර්ෂ 2010 වෙනුවෙන් ගෙවන ලද එකතුව රු.252,682 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබූ අතර , 2009 හා 2011 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.77,592 ක් වූ විගණන ගාස්තු මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 168 ප්‍රකාරව සියළුම ලැබීම් වෙනුවෙන් පොදු 172 ආකෘතිය යටතේ ලදුපතක් නිකුත් කළ යුතු වුවත්, එකතුව රු.98,464,818 ක් වූ ලැබීම් වෙනුවෙන් කොමිෂන් සභාව විසින් ලදුපත් නිකුත් කර නොතිබිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.18,536,369 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,902,700 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.15,633,669 ක පිරිහීමක් ඇතිවීම කෙරෙහි නීති උදානය වැඩසටහන් වියදම් ද ඇතුලුව පරිපාලන වියදම් රු. 44,036,155 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

2010 වර්ෂයේදී රු.6,423,543 ක් ව පැවති අතිරික්තය, 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.2,902,700 ක් හා රු. 18,536,369 ක ඌනතාවයක් බවට පත්වීමෙන් මූල්‍ය ප්‍රතිඵලය පිරිහෙමින් පැවතුණි. එම හේතුව නිසා ඉකුත් වර්ෂ 03 හි සමුච්චිත අරමුදලේ බැර ශේෂය පිළිවෙලින් රු.23,099,977 ක්, රු.20,197,277 ක් හා රු.1,660,909 ක් දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව සහ එහි ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් නඩු 5837 ක් අවසන් කර තිබු නමුත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් නොවිසඳු නඩු සංඛ්‍යාව 27,601 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් මධ්‍යස්ථාන 72 ක් මගින් පුද්ගලයින් 47,435 ක් සඳහා නීති උපදෙස් ලබා දී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී නව නීති ආධාර මධ්‍යස්ථාන 07 ක් ආරම්භ කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 පරිච්ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**4.2** කාර්ය මණ්ඩලය පරිපාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 පරිච්ඡේදය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 215 ක් විය. සමාලෝචිත වර්ෂයේදී නව පත්වීම් 38 ක් ලබා දී තිබුණි.

**05 . පද්ධති හා පාලන**

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය.

(ආ) මූල්‍ය පාලනය.